# සම්‍යග්ඥානය

## අන්නම්භට්ටගේ (තර්කසංග්‍රහය) නිර්වචනය

මිතුරුප්පේ ධම්මානන්ද හිමි

This article deals with some of the basic concepts of Indian logic. It is important to note that there is a remarkable between Indian logic and Western logic and they have two different foundations. Three systems of logic are found in India i.e.Jain logic, Buddhist logic and Hindu logic. Two of the most important works on logic are Tarkasangraha and Saptapadarthi. Thakasangraha could be regarded as a compendium of Hindu logic and its main objective is to provide an analytical explanation of the universe on a logical basis. Many important concepts related to logic are explained in the book such as dialectic, inference and syllogism, perception, non-perception fallacies, reasons and analogy etc. Though it is useful to have a comprehensive knowledge on logic, there is a predominant difference between Buddhist and Hindu logic

භාරතීය න්‍යාය ශාස්ත්‍රය බෞද්ධ, ජෛන සහ හින්දු යනුවෙන් තෙවැදෑරුම් වන අතර තර්කසංග්‍රහය අයත් වන්නේ එයින් හින්දු න්‍යාය ශාස්ත්‍රයට ය. න්‍යාය හා වෛශේෂික දර්ශනවාද දෙකෙහි මූලික ඉගැන්වීම් සංකලනය කොට 7 වන සියවස අගභාගයේ දී ආන්ද්‍ර දේශයේ විසූ අන්නම්භට්ට නම් ආචාර්යවරයෙකු විසින් තර්කසංග්‍රහය රචනා කරන ලදී. 11 වන සියවසේ ශිවදත්ත නම් පඬිවරයෙකු විසින් වෛශේෂික දර්ශනය ඇසුරෙන් ලියන ලද **සප්තපදාර්ථි** නම් කෘතිය මොහුගේ ප්‍රධාන ආශ්‍රය විය. ප්‍රමුඛ තාර්කිකයෙකු නොවන අන්නම්භට්ට විචාරකයෙකු ලෙසින් න්‍යාය වෛශේෂික දර්ශනවාදයන් ඒකාබද්ධ කොට සැකෙවින් හා සරල බසින් මෙම කෘතිය සංග්‍රහ කිරීම අතිශයින් ප්‍රශස්ත කර්තව්‍යයකි. මෙම ලිපියේ අරමුණ තර්කසංග්‍රහය තුළ විවරණය වන අදහස් සමාලෝචනය කිරීම වන හෙයින් ඊට ආරම්භයක් ලෙසින් භාරතීය ෂඩ් දර්ශනය පිළිබඳ සැකෙවින් දැක්වීම සුදුසුය.